රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2021.05.17**

**නිවේදන අංකය: 478 /2021**
**නිකුත් කළ වේලාව:22:15**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ**
**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු**

**<u>අද කොවිඩ් මරණ 19 යි</u>**

2021 මැයි 10 දින සිට මැයි 17 දක්වා සිදුව ඇති කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ 19 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අද (17) තහවුරු කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවෙන් වාර්තා වන මුළු කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ සංඛ්‍යාව 981 කි.

01. බොරලැස්ගමුව ප්‍රදේශයේ පදිංචි 81 හැවිරිදි පුරුෂයෙකි. කොළඹ ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර 2021 මැයි 16 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව සහ ඇදුම රෝගයයි.

02. මැදකීඹිය ප්‍රදේශයේ පදිංචි 66 හැවිරිදි පුරුෂයෙකි. 2021 මැයි 14 වන දින නිවසේ දී මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

03. වස්කඩුව ප්‍රදේශයේ පදිංචි 75 හැවිරිදි පුරුෂයෙකි. 2021 මැයි 15 වන දින කළුතර මහ රෝහල වෙත ඇතුළත් කරන අවස්ථාව වන විට මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් 19 ආසාදනය, ලේ විෂවීම, දියවැඩියාව සහ අධි රුධිර පීඩනයයි..

04. මග්ගොන ප්‍රදේශයේ පදිංචි 89 හැවිරිදි පුරුෂයෙකි. 2021 මැයි 15 වන දින කළුතර මහ රෝහල වෙත ඇතුළත් කරන අවස්ථාව වන විට මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ ලේ විෂවීම සහ කොවිඩ් ආසාදනයයි

05. කළුතර ප්‍රදේශයේ පදිංචි 89 හැවිරිදි පුරුෂයෙකි. 2021 මැයි 14 වන දින කළුතර මහ රෝහලට ඇතුළත් කරන අවස්ථාව වන විට මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ ලේ විෂවීම, කොවිඩ් ආසාදනය, නිධන්ගත වකුගඩු රෝගය, හෘද රෝගී තත්ත්වය සහ අධි රුධිර පීඩනයයි.

06. පයාගල ප්‍රදේශයේ පදිංචි 79 හැවිරිදි පුරුෂයෙකි. 2021 මැයි 13 වන දින කළුතර මහ රෝහල වෙත ඇතුළත් කරන අවස්ථාව වන විට මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ ලේ විෂවීම සහ කොවිඩ් 19 ආසාදනයයි.

07. මොරටුව ප්‍රදේශයේ පදිංචි 63 හැවිරිදි පුරුෂයෙකි. කොස්ගම රෝහලේ සිට කොවිඩ් ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසුව හෝමාගම මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේ දී 2021 මැයි 17 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

08. අඹේපුස්ස ප්‍රදේශයේ පදිංචි 45 හැවිරිදි පුරුෂයෙකි. මීරිගම මූලික රෝහලේ සිට හෝමාගම මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේ දී 2021 මැයි 16 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை வெனியூ, கொழும்பு 05, இலங்கை.
දුරකථන / தொலைபேசி (+94 11) 2515759
ෆැක්ස් / தொலைநகல் (+94 11) 2514753
www.news.lk

09. ගාල්ල ප්‍රදේශයේ පදිංචි 57 හැවිරිදි කාන්තාවකි. හික්කඩුව කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයේ සිට හෝමාගම මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේ දී 2021 මැයි 15 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

10. රඹුක්කන ප්‍රදේශයේ පදිංචි 89 හැවිරිදි පුරුෂයෙකි. කෑගල්ල ශික්ෂණ රෝහලේ සිට කොළඹ ජාතික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේ දී 2021 මැයි 16 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

11. පොල්ගොල්ල ප්‍රදේශයේ පදිංචි 83 හැවිරිදි කාන්තාවකි. මහනුවර ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී කොවිඩ් නියුමෝනියා තත්වය හේතුවෙන් 2021 මැයි 16 වන දින මියගොස් ඇත.

12. ගාල්ල ප්‍රදේශයේ පදිංචි 81 හැවිරිදි කාන්තාවකි. 2021 මැයි 15 වන දින නිවසේදී මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියා තත්වයයි.

13. කටුවන ප්‍රදේශයේ පදිංචි 54 හැවිරිදි පුරුෂයෙකි. කරාපිටිය ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී කොවිඩ් නියුමෝනියාව හේතුවෙන් 2021 මැයි 16 වන දින මියගොස් ඇත.

14. පාදුක්ක ප්‍රදේශයේ පදිංචි 76 හැවිරිදි පුරුෂයෙකි. හෝමාගම මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2021 මැයි 16 වන දින කොවිඩ් නියුමෝනියාව හේතුවෙන් මිය ගොස් ඇත.

15. දඹුල්ල ප්‍රදේශයේ පදිංචි 63 හැවිරිදි පුරුෂයෙකි. වැලිකන්ද විශේෂ ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබමින් සිටින අතර 2021 මැයි 17 වන දින මියගොස් ඇත. උග්‍ර කොවිඩ් නියුමෝනියාව හේතුවෙන් මියගොස් ඇත.

16. දෙනිය ප්‍රදේශයේ පදිංචි 59 හැවිරිදි කාන්තාවකි. මාරවිල මූලික රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව ජාතික බෝවන රෝග විද්‍යායතනය වෙත මාරු කර යවා ඇත. එහිදී 2021 මැයි 16 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව, අධි රුධිර පීඩනය, හා දියවැඩියා තත්වයයි.

17 හපුගස්තලාව ප්‍රදේශයේ පදිංචි 79 හැවිරිදි පුරුෂයෙකි. නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහලට ඇතුලත් කරන අවස්ථාවේදී 2021 මැයි 10 වන දින කොවිඩ් 19 අසාදනය හේතුවෙන් ඇති වූ හෘද රෝගී තත්වය.

18. උඩපිටිවල ප්‍රදේශයේ පදිංචි 42 හැවිරිදි පුරුෂයෙකි. තෙල්දෙණිය මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2021 මැයි 16 වන දින මිය ගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ උග්‍ර කොවිඩ් නියුමෝනියාව, දියවැඩියාව, අධි රුධිර පීඩනය සහ අපස්මාර රෝගී තත්වය

19. කඩුවෙල ප්‍රදේශයේ පදිංචි 80 හැවිරිදි කාන්තාවකි. කොළඹ ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2021 මැයි 12 වන දින කොවිඩ් 19 ආසාදනය සමග අධි රුධිර පීඩනය හේතුවෙන් මියගොස් ඇත.

**මොහාන් සමරනායක**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**